# දඹදෙණි යුගයේ පූජනීය දළදා සංස්කෘතිය

## The sacred tooth relic culture of the Dambadeniya period

ආචාර්ය ඇහැලේපොල මහින්ද හිමි

**Abstact**

This study investigates the formative stages of the sacred Tooth Relic culture in Sri Lanka, with a specific focus on its establishment and burgeoning significance during the Dambadeniya period. Examining the historical context of the Tooth Relic's arrival, precipitated by internal political instability within the Kalingu kingdom of India and the perceived need for its protection, this research analyzes the initial, uninvited introduction of this venerated object to the island. Drawing upon primary Pali chronicles and the Dātāvamsa, attributed to Venerable Dharmakirti, this analysis elucidates the circumstances surrounding the clandestine journey of Prince Dantha and Princess Hemamāla, disguised as Brahmins, and their arrival in Sri Lanka during the reign of King Kithsiri Mevan. Furthermore, this study highlights the initial lodging of the relic within a Dewalaya, a crucial detail that underscores the nascent stages of its integration into the Sinhala Buddhist society. Understanding the genesis of the Tooth Relic tradition is paramount for comprehending its subsequent role as a potent symbol of royal legitimacy, religious authority, and national identity in Sri Lanka. This research sheds light on the unexpected origins of a cultural phenomenon that profoundly shaped the socio-political landscape, particularly during the Dambadeniya

era, influencing statecraft, religious practices, and artistic expressions. By examining this foundational period, this study contributes to a deeper understanding of the enduring legacy of the sacred Tooth Relic in Sri Lankan history. This research resides within the interdisciplinary fields of Sri Lankan History, Buddhist Studies, and Cultural Anthropology. It explores the intricate interplay between political events, religious beliefs, and the development of cultural practices associated with a significant religious artifact. The primary objects of this research encompass the sacred Tooth Relic itself as a tangible historical and religious artifact, alongside the Pali chronicles that document early Sri Lankan history and the relic's arrival. The Dātāvamsa serves as a key textual source detailing the initial events, while the socio-political environment of both the Kalingu kingdom and Sri Lanka during the transitional periods leading up to and encompassing the early Dambadeniya influence forms a crucial contextual backdrop for this investigation. This study employs a historical-critical methodology, involving: In-depth examination of primary textual sources, including Pali chronicles and the Dātāvamsa, to extract and interpret information regarding the Tooth Relic's arrival and initial placement. Situating the events within their broader historical, political, and religious contexts in both India and Sri Lanka to understand the motivations, actions, and implications of the relic's introduction.

**Keywords:** Sacred Tooth Relic, Dambadeniya, Pali chronicles, Cultural Origins

**හැඳින්වීම**

දඹදිව කළිගු රටෙහි පැවැති ආභ්‍යන්තරික දේශපාලන හා රාජ්‍ය තන්ත්‍රයේ අරාජික තත්ත්වය නිසා වාම ශ්‍රී දළදා වහන්සේට

සිදුවිය හැකි සතුරු විපත් හානි ආදියෙන් දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීමේ අරමුණින් දළදා වහන්සේ ලංකාවට වැඩම කොට ඇත. දෙව් මිනිසුන් විසින් වදිනා ලද උත්තම වාම ශ්‍රී දළදා වහන්සේ රැගෙන බමුණු වෙස් ගෙන ලක්දිවට යන ලෙස එකල්හි ගුහසීව රජු, දන්ත කුමරුට පැවසූ බව පාලි වංසකථා සාහිත්‍යයෙන් විද්‍යමාන වේ. ඒ අනුව ශ්‍රී ලංකාවට වාම ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඩම කරන්නේ ලාංකිකයන්ගේ ආරාධනාවකින් තොර ව ය.

සුරනර නමිතං තං දන්තධාතුං ගහෙත්‍වා
ගහිත දිජ විලාසො සීහළං යාහි දීපං
ඉති වචන මුදාරං මාතුලස්සා'ථ සුත්‍වා
තමච්ච ගුහසීවං දන්තනාමො කුමාරො,
(දාඨාවංසය, 2000: 177).

මහසෙන් රජතුමාගේ පුත් වූ කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු හෙවත් කිත්සිරිමෙවන් රජුගේ රාජ්‍යත්වයෙන් නවවැනි අවුරුද්දෙහි එම බමුණු වෙස් ගත් හේමමාලා සහ දන්ත කුමරු දෙදෙනා ලක්බිමට පැමිණි බවත් ඔවුන් එසේ දළදාව වඩමවා ගෙන පැමිණ නැවතී ඇත්තේ සිත්කලු දේවාලයක ය. ඒ බව පොළොන්නරු යුගයේ ලීලාවතී රැජිණියගේ රාජ්‍ය කාලයේ දී සාරිපුත්ත සංඝරාජයාණන් වහන්සේගේ ශිෂ්‍ය වූ ධර්මකීර්ති මාහිමියන් විසින් රචිත දාඨාවංසයෙහි සඳහන් වී ඇත.

සංවච්ඡරමහි නවමම්හි මහාදිසෙන
පුත්තස්ස කිතතිසිරිමෙඝ නරාධිපස්ස
තෙ ජම්පතී තමථ පට්ටන මොතරිත්‍වාන
දෙවාලයෙ පටිවසිංසු මනොභි'රාමෙ,
(දාඨාවංසය, 2000: 190).

කෙසේ වෙතත් මහාවංසයෙහි තිස්හත් වැනි පරිච්ඡේදයෙහි සඳහන් වන්නේ දළදා වහන්සේ කලිඟු රට සිට එක්තරා බැමිණියක විසින් කිත්සිරිමෙවන් රජුගේ නව වෙනි

රාජ්‍ය වර්ෂයෙහි දී ලංකාවට වැඩමවා ගෙනආ බව යි.

නවමෙ තස්ස වස්සම්හි දාඨාදාතුං මහෙසිනො

බ්‍රාහමණි කාචි ආදාය කාලිඞ්ගම්හා ඉධානයි,

(මහාවංසො, 1959: 213).

''ඒ රජු දවස් නව වන වස එක්තරා බැමිණියක් තොමෝ බුදු රජුහු දළදාව කළිඟු රටින් මෙහි ගෙණවා....'', (සිංහල මහාවංසය, 1998: 167). මේ අනුව ක්‍රි. පූ. 301-328 තෙක් රජ කළ කිත්සිරිමෙවන් රජුගේ නව වැනි රාජ්‍ය වර්ෂයේ දී නිසැක වශයෙන් ම වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ දඹදිව සිට ලක්දිවට වැඩම කොට ඇති බව මහාවංසය, දාඨාවංසය වැනි පාලි වංසකථා මූලාශ්‍රය මඟින් සනාථ වේ. අනතුරු ව දළදා වහන්සේ පිළිබඳ ව අධික සොම්නසින් යුතු ව පූර්ණ චන්ද්‍රයාට සමාන මුහුණ ඇති කිත්සිරිමෙවන් රජතුමා විසින් බුදුරජාණන් වහන්සේගේ ඒ දළදා වහන්සේට මේ සියලු ම සිංහලද්වීපය පූජා කර ඇත.

ඉත්ථං විචිනතිය පමොදභරාතාරෙක

සම්පුණ්ණ චන්දිම සරික්ඛ මුඛො නරින්දො

සබ්බඤ්ඤුනො දසනධාතුවරස්ස තස්ස

පූජෙසි සමබමපි සීහළදීප මෙතං,

(දාඨාවංසය, 2000: 210).

මින් අනතුරු ව විවිධ රාජකීයයන් මෙලෙස දළදා වහන්සේ උදෙසා සමස්ත ශ්‍රී ලංකාද්වීපය ම පූජා කර ඇති බව පෙනේ. මෙනිසා ම දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකෙතය බවට දූරාතීතයේ සිට ම පත් වී ඇත.

**පර්යේෂණ ගැටලුව**

ලෝකවාසී බෞද්ධ අබෞද්ධ සියලු සැදැහැවතුන්ගේ ජීවමාන බුදුරජාණන් වහන්සේ වශයෙන් සැලකෙන සම්බුදුරජාණන් වහන්සේගේ වාම ශ්‍රී දන්තධාතූන් වහන්සේගේ දළදා සංස්කෘතිය

නැතහොත් දළදා සිරිත, දළදා පුවත දඹදෙණිය රාජධානිය තුළ පාලි වංසකතා මූලාශ්‍රය ඇසුරෙන් කෙසේ විකාශය වී ඇත්තේ දැයි විමසීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

**පර්යේෂණ අරමුණ**

පූජනීය දළදා සංස්කෘතිය පිළිබඳ ව බොහෝ තොරතුරු ශ්‍රී ලංකාවේ අතීත සෑම රාජධානියකට ම අයත් සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රයවල වර්ණනා වී සහ සඳහන් වී ඇත. දඹදෙණි යුගයේ දළදා සංස්කෘතිය පිළිබඳ පාලි වංසකතා මූලාශ්‍රයන්හි දක්වන තොරතුරු සමාජයට ශාස්ත්‍රීය ව එළිදැක්වීමක් සිදු වී ඇත්තේ අල්ප වශයෙනි. එම නිසා දඹදෙණි යුගයේ පූජනීය වාම ශ්‍රී දළදා සංස්කෘතිය හා සම්බන්ධ පාලි වංසකතාගත තොරතුරු ඉදිරිපත් කිරීම මෙම ශාස්ත්‍රීය පර්යේෂණයෙහි අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ග්‍රන්ථාගත තොරතුරු තාර්කික හා විධිමත් ව විශ්ලේෂණය කිරීම පදනම් කොටගත් ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය මෙහි මූලික පර්යේෂණ ක්‍රමවේදය යි. මහාවංසය හා දාඨාවංසය ආදි පාලි වංසකතාවන් ප්‍රාථමික මූලාශ්‍රයන් වශයෙන් ද අනෙකුත් ද්විතීයික මූලාශ්‍රයන් ද විමර්ශනය කරමින් ගුණාත්මක පර්යේෂණයක් සිදුකිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

**සාකච්ඡාව**

ක්‍රි.ව. 1220- 1293 දක්වා වූ කාල වකවානුව දඹදෙණිය රාජධානියට අයත් වන අතර එහි තුන් වැනි විජයබාහු, දෙවැනි පරාක්‍රමබාහු, හතර වැනි විජයබාහු, පළමු වැනි බුවනෙකබාහු හා තුන් වැනි පරාක්‍රමබාහු ආදි රජවරු පස් දෙනෙකු රජ කොට ඇත. සිරිසඟබෝ රජ පෙළපතින් පැවත ගෙන එන විජයබා කුමරු කාලිංගමාඝ ආක්‍රමණයේ දී වනගත ව සිට පසු ව වන්නි රාජ බවට පැමිණ මායා රටෙහි සිංහල ප්‍රධානීන් එකතුකර ඒ

ප්‍රදේශයේ දෙමළ ප්‍රධානීන් පන්නා හැර දඹදෙණි පව්ව මත එහි රාජධානියක් ඉදිකරගෙන ප්‍රසිද්ධ රජෙකු මෙන් වාසය කළේය. ලංකා ඉතිහාසයේ තුන්වන විජයබාහු යනුවෙන් හැඳින්වෙන්නේ මෙතුමා වන අතර දඹදෙණි රාජධානියේ ආරම්භකයා වන්නේ ද මොහු ය. පැරණි සිංහල රාජ්‍යයක පැවැති අංගෝපාංග නො අඩුව ඇති කරවා විජයබා රජු මේ දඹදෙණි නුවර ලංකාවේ රාජධානිය බවට පත්කරවීය. මේ වනාහි මායා රටේ ඇති වූ ප්‍රථම රාජධානිය යි (සන්නස්ගල,1998: 120). පොළොන්නරුව රාජධානිය බිඳ වැටී දඹදෙණි රාජධානිය ආරම්භ වීමත් සමඟ ම පළමු ව තුන්වැනි විජයබාහු රජු කොත්මලේ සඟවා තිබු දළදාව සහ පාත්‍ර ධාතුන් වහන්සේලා මහසඟරුවන පෙරදැරිව මහපෙරහැරෙන් දඹදෙණියට වඩමවා ගැනීම සිදු විය. මේ අනුව දළදා වහන්සේ දඹදෙණි යුගයේ දී ද ලක්දිව රාජ්‍යත්වයේ සංකෙතය වූ බව පැහැදිලි ය.

පුරක්ඛත්වා මහාථෙරසඞ්ඝං තං ස මහීපතී

ආගමී සහ සෙනාය තඤ්ච කොත්ථුමලාචලං,

(මහාවංසො, 1959: 525).

කාරාපෙත්වා මහාපූජං පබ්බතසමා සමන්තතො

දක්ඛි ච'ත්තමනො දාඨාපත්තධාතුද්වයං තහිං,

(මහාවංසො, 1959: 525).

විජයබාහු රජතුමා කොත්මලේ තිබූ දළදාව සහ පාත්‍ර ධාතුන් වහන්සේලා දඹදෙණියට මහාසංඝරත්නය පෙරදැරිව වඩමවා ගෙන තම රාජකීය තත්ත්වය ආගමෙන් හා නීතියෙන් අනුමත කරවා ගත්තේය (වජිර හිමි, 2008: 335). දඹදෙණි යුගයේ දී දළදා වහන්සේ සහ පාත්‍ර ධාතුන් වහන්සේලා තැන්පත් කොට ඇත්තේ පිහිටි පොළොවක ඉදිකළ දළදා මන්දිරයක නොව රැපුසතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා සුවිශාල ගල් පර්වතයක මුදුනෙහි සකසා ගත් ධාතුසරයක බව මහාවංසය පැහැදිලි කරයි.

පාකාරගොපුරාදීහි තථා කත්‍වා සුරක්ඛිතං

තසස මුද්ධනි සෙලස්ස දාඨාදාතුසරං වරං,

මහාවංසො, 1959: 526).

තස්මිං ධාතුසරෙ දාඨාපත්තදාතුද්වං සුධී

උස්සවෙන මහන්තෙන පතිට්ඨාපෙසි සාදරං,

(මහාවංසො, 1959: 526).

මෙහි සඳහන් ගල් පර්වතය බෙලිගල පර්වතය යනුවෙන් හැඳින්වේ. දළදාව වහන්සේ දඹදෙණියට වැඩම වා ගත් පසු විජයබා රජු එය කිසිදු සතුරෙක් ට පැහැර ගත නොහැකි වන සේ අතිශයින් දුෂ්කර වූ බෙලිගල පර්වත මස්තකයෙහි තෙමහල් මන්දිරයක් ඉදි කරවා එහි තැන්පත් කළ බව (වජිර හිමි, 2008: 336) පාලි වංසකථා ඇතුළු බොහෝ මූලාශ්‍රයවල දැක්වේ. ශ්‍රී ලංකාවේ දුරාතීතයේ සිට ම ඇති වූ ආභ්‍යන්තරික දේශපාලන අවුල් වියවුල් තත්ත්වයන් නිසා රාජධානි නිරිතදිගට සංක්‍රමණය විය. ඒ අනුව දඹදෙණි රාජධානිය ආරම්භ වන විට පැවති ආභ්‍යන්තරික දේශපාලන අවුල් වියවුල් ස්වභාවය හේතුවෙන් වාම ශ්‍රී දළදා වහන්සේගේ සහ රජතුමාගේ ආරක්ෂාව පිණිස දළදා වහන්සේ මෙබඳු පර්වතයක් මස්තකයෙහි ධාතුසරයක තැන්පත් කරන්නට ඇත. ආර්. ඩබ්ලිව්. අයිවර්ස්, 1884 දී මෙම දළදා පර්වතයේ නටබුන් පිළිබඳ ව ප්‍රථමවරට පරික්ෂා කර බැලූ ගවේශකයා වශයෙන් සැලකේ (වජිර හිමි, 2008: 337). තම පියා විසින් බෙලිගල පර්වත මස්තකයෙහි ධාතුසරයක තැන්පත් කර තිබූ දළදා වහන්සේ ඔහුගේ පුත් වන දෙවන පරාක්‍රමබාහු රජතුමා දඹදෙණි නුවරට ම වඩමවා ස්වකීය රජමැදුර අසල ම කර වූ දළදා මන්දිරයක තැන්පත් කර තමාට දවසකට තුන් වතාවක් අභිමත ආකාරයෙන් පූජනීය දළදා වහන්සේ වන්දනා කිරීම පිණිස රාජ මාලිගාව ආසන්නයේ ම දළදා මන්දිරයක් ඉදිකර ඇත.

සාදරං තීසු වෙලාසු චින්තිතෙ චින්තිතෙ ඛණෙ

වන්දිතුං දන්තධාතුං මෙ ජනො අත්‍ථීති චින්තයං,

(මහාවංසො, 1959: 530).

අත්තනො භවන්ස්සෙව සන්තිකෙ ධරණීපති
දන්තධාතුඝරං රම්මං කාරාපෙසි මහග්ඝකං,
(මහාවංසො, 1959: 530).

දඹදෙණි යුගයේ ක්‍රි.ව. 1236 - ක්‍රි.ව. 1270 දක්වා දීර්ඝ කාලයක් (වසර 34) රාජ්‍ය විචාල දෙවැනි පරාක්‍රමබාහු රජතුමා බුදුසමය කෙරෙහි භක්තිමත් ශ්‍රද්ධාවන්ත පාලකයෙකි. මෙතුමා සිය රාජධානියේ සෑම වැදගත් ස්ථානයක් පාසා විහාරස්ථාන හා බෞද්ධ විහාර ආරාම ඉදිකිරීමත් ඒ විහාර ආරාමවල පාරිශුද්ධත්වය සහ රාජකීයත්වය තහවුරු කිරීම සඳහා ඒ තැන් කරා පූජනීය දළදා වහන්සේ මහත් පෙරහරින් වැඩමවා ප්‍රදර්ශනය හා පුදපූජා පැවැත්වීමත් සිරිතක් වශයෙන් සිදු කර ඇත (වජිර හිමි, 2008: 345). නූතනයෙහි ලෝක සත්ත්වයන්ට සෙත්පතා වාම ශ්‍රී දළදා ප්‍රදර්ශනය සිදුකරන්නේ අස්ගිරි මල්වතු ශ්‍රීමත් මහානායක මාහිමියන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් හා අවවාද අනුශාසනය ඇතිව දියවඩන නිලමේතුමාගේ මැදිහත් වීමෙන් සහ රජයේ අනුග්‍රහය සහිතව ය. එම පූජනීය සද්කාර්ය සිදුවන්නේ වාම ශ්‍රී දළදා වහන්සේ වැඩ ඉන්න මහනුවර දළදා මන්දිරය තුළ දී පමණි. දඹදෙණි යුගයේ දී මහජනයාගේ ශුභසිද්ධිය පිණිස දළදා පෙරහැර සමඟ දළදා ප්‍රදර්ශනය සිදු කර ඇති අතර එය සිදුකර ඇත්තේ දළදා වහන්සේ වැඩසිටි දළදා මන්දිරයෙහි නොව වෙනත් තදාසන්න විහාරස්ථාන කිහිපයක ය. දඹදෙණි යුගයේ දී දළදා ප්‍රදර්ශන පැවැත් වූ විහාරස්ථාන දෙකක් වශයෙන් සිරිවර්ධනපුරය සහ සිරිවිජේසුන්දරාමය (මෙම විහාරස්ථානය දළදා වහන්සේ ප්‍රදර්ශනය කිරීම සඳහා තුන් වැනි විජයබාහු රජු විසින් ඉදි කර ඇති අතර ඔහුගේ පුත් දෙවැනි පැරකුම්බා රජු වසර දොළහක් මෙහි වැඩ සිටිය දළදා වහන්සේට පුදපූජා පැවැත් වූ බව දඹදෙණි අස්නෙහි දැක් වේ.) සැලකිය හැකි ය. මෙම දළදා ප්‍රදර්ශනය උසස් අන්දමින් පැවැත් වූ දළදා පෙරහැරක් ම ය. තම රාජධානියේ වැදගත් ස්ථානයන් කරා දළදා වහන්සේ මහපෙරහරින් වැඩම වීම මෙකල පැවැති විශේෂ චාරිත්‍රයකි. තම රාජධානියේ වැදගත් කේන්ද්‍රස්ථානයන් වෙත දළදා වහන්සේ ප්‍රදර්ශනය කිරීම සඳහා මහත් හරසරින් පෙරහැර

පවත්වා දළදා වහන්සේ වැඩමවා ගෙන ගොස් දළදා ප්‍රදර්ශනය කිරීමෙන් රාජ්‍යත්වයේ සුරක්ෂිත බව, නිරර්බුධ බව, රටවැසියාගේ රජය කෙරෙහි ඇති පක්ෂපාති බව හා ප්‍රගතිශීලී බව යනාදිය ඇතිවන බව නො අනුමාන ය. මේ අනුව දඹදෙණි යුගයේ දී දළදා සංස්කෘතියේ දළදා පෙරහැරත් දළදා ප්‍රදර්ශනයත් දෙක ම තිබී ඇත.

උක්ත දළදා පෙරහැර හා දළදා ප්‍රදර්ශනය පැවති එක් ස්ථානයක් වන්නේ දඹදෙණි සිරිවර්ධනපුරයේ තිබූ විහාරස්ථානයක් සැලකේ. මෙහි සිරිවර්ධනපුරය යනු දෙවැනි පරාක්‍රමබාහු රජතුමා උපන් ප්‍රදේශය යැයි සැලකුව ද ඒ පිළිබඳ ව වියතුන්ගේ ඒකමතිකත්වයක් නොමැත. දඹදෙණියට අඩ යොදුනකට ඇතින් පිහිටි මෙම සිරිවර්ධනපුරයෙහි අංගසම්පූර්ණ විහාරස්ථානයක් ඉදිකර වූ රජතුමා එම විහාරස්ථානට විසිතුරු විචිත්‍ර මනරම් පෙරහැරකින් දළදා වහන්සේ වඩමවාගෙන ගොස් දළදා ප්‍රදර්ශනය කර ඇති බව මහාවංසයෙහි සඳහන් වේ.

පාසාදමණ්ඩපොපෙතං තුඞ්ගපාකාරගොපුරං

බොධිචෙතිය ආරාමපටිමාඝර මණ්ඩිතං,

(මහාවංසො, 1959ඃ 540).

පෙරහැර මාර්ගය, සමතලා කොට සුදුවැලි අතුරා ධජ පතාක එල්ලා සරසන ලද පෙරහැර මාර්ගය මත දළදා මැදුරේ සිට සිරිවර්ධනපුරය දක්වා පෙරහැර ගමන් කරවීය. පූජනීය දළදාව හා පාත්‍ර ධාතුන් වහන්සේලා චමත්කාරජනක රථයක වඩා හිඳුවා වැඩම කරවන ලද අතර රනින් හා රිදියෙන් කළ විසිතුරු ධජ පතාකාදිය ද රනින් හා රිදියෙන් කළ පුන්කලස් එම රන්රිදීමුවා කරඬු ද විවිධ පූජා වස්තූන් ද රැගත් ආවතේවකාරයෝ පිළිවෙළින් එහි ගමන් කළෝය. අනතුරු ව ගමන් කළේ චතුරාගිනී සේනාව සහිත රජතුමා ය.

තතො සයම්පි භූපාලො සබ්බාභරණභූසිතො

සෙනාය චතුරඞගිනායා සද්ධිං සද්ධාය චොදිතො,

(මහාවංසො, 1959ඃ 541).

දඹදෙණි යුගයේ දළදා පෙරහැරේ දී දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍ර ධාතූන් වහන්සේලා මනරම් රියක තබා ඊට පිටුපසින් දෙවැනි පරාක්‍රමබාහු රජතුමා චතුරාංගනී සේනාව සමඟ පෙරහැරේ ගමන් කළ ආකාරය මේ අනුව පැහැදිලි වේ. දළදා පෙරහැරේ රජතුමා දන්ත ධාතූන් වහන්සේට පසුපසින් ගමන් කිරීම දඹදෙණි යුගයේ පමණක් නොව පොළොන්නරු යුගයේ දී ද සිදු වී ඇත. එතුළින් දළදා පෙරහැරෙහි රාජකීයත්ත්වය හා සම්භාවනීයත්ත්වය තීව්‍ර වේ. නූතන මහනුවර ඇසළ පෙරහැර සංවිධානය වී ඇත්තේ පෙරහැර කරඬුව සහිත හස්තිරාජයන්ගේ පිටුපසින් දියවඩන නිලමේතුමා පංචතූර්ය නාදය සහිත ව ගමන් කිරීම යි. 'නූර්ති ගීත වාදන දක්වන්නෝ රජු පිරිවරා ගමන් ගත්තෝය. මෙසේ සමන්විත පෙරහැරේ ගමන් කළ ඇතුන්ගේ කුංචනාදයෙන් අශ්වයන්ගේ හේෂාරවයෙන් තැන තැන නට නටා යන නාට්‍යකරුවන්ගෙන් ගී ගයා රැඟුම් පාමින් යන ස්ත්‍රීන්ගෙන් හා පංචතූර්ය භාණ්ඩයන්ගෙන් නිකුත් වූ මිහිරි ස්වරයෙන් ද නැගුණු මහාඝෝෂාව මහපොළොව ගුගුරන්නාක් මෙන් විය'. පෙරහැර සිරිවර්ධනපුරයට ළඟා වූ විට දළදා වහන්සේ එහි මාණික්‍ය මණ්ඩපයක වඩාහිඳුවා මහජනයාට ප්‍රදර්ශනය කරමින් පුදපූජා පවත්වන ලදි. මාස තුනක් මුළුල්ලෙහි මෙම දළදා ප්‍රදර්ශනය සිදු කරන අතර මුළු සිරිවර්ධනය නොයෙක් ශ්‍රීයෙන් ශෝභාමත් වන්නේ ය (වජිර හිමි, 2008: 417).

මෙය අනුරාධපුර සමයේ දී දළදා වහන්සේ පෙරහරෙන් වැඩම කොට අනූ දිනක් අභයගිරියේ තැන්පත් කර තැබීමේ පුරාණ චාරිත්‍රයට හා සමාන වන බව පෙනී යයි. සත්‍යගරුක කිත්සිරිමෙවන් රජතුමා දළදා වහන්සේ අවුරුදු පතා අභයගිරි විහාරයට ම වැඩම කරවා නව ලක්‍ෂයක් වියදම් කර වාර්ෂික ව දළදා පූජාව කළ යුතු යැයි සිරිත් ලේඛනයක් පිහිටු වූ බව දාඨාවංසයෙහි දැක්වේ.

ධාතුං විහාරං මහයුත්තර මෙව නෙත්‍වා
පූජං විධාතු මනු වච්ඡර මෙව රූපං
රාජා'ථ කිත්තිසිරිමෙඝ සමව්හයො සො
චාරිත්ථ ලෙඛ මභිලෙඛයි සච්ච සන්ධො,
(දාඨාවංසය, 2000: 230).

දළදා වහන්සේ දළදා මන්දිරයෙන් පිටත පූජනීය ස්ථානයකට වැඩමවාගෙන ගොස් ප්‍රදර්ශනය කර දින අනූවකට (මාස තුනකට) පසු ව නැවත දළදා මන්දිරය වෙත පෙරහැරින් වැඩමවා ගෙන ඒම දූරාතීත දළදා පෙරහර සංස්කෘතියේ මූලිකාංග යක් වූ බව මේ අනුව පෙනී යයි. මෙම චාරිත්‍රය අනුරාධපුරයේ සහ දඹදෙණි යුගයේ දී සිදු වී ඇති බව පැහැදිලි ය. වත්මන් මහනුවර දළදා පෙරහැර සංස්කෘතිය තුළ එබඳු දීර්ඝ කාලයක් දළදා වහන්සේ දළදා මැඳුරෙන් පිටත නැවතී වැඩසිටීමක් හෝ එබඳු දීර්ඝ කාලීන දළදා ප්‍රදර්ශනයක් සිදු නොවන අතර ඒ වෙනුවට සිදු වන්නේ අවසන් රන්දෝලි පෙරහැර දින අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරයට පෙරහර කරඬුව වඩමවා එහි එක රැයක් තැන්පත් කොට පසුදා උදෑසන සහ දවල් රාජකීය සම්බුද්ධ පූජාව පවත්වා දහවල් පෙරහැරින් නැවත දළදා මන්දිරයට පෙරහැර කරඬුව වැඩම වීම ය. එහි දී දළදා ප්‍රදර්ශනයක් සිදු නොවන නමුත් පැරණි චාරිත්‍රානුකූල පවත්වන රාජකීය දළදා පූජා විධීන් ඒ ආකාරයෙන් ම එහි දී සිදු වේ.

අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය අස්ගිරි මහාවිහාර පරිශ්‍රයෙහි ඇති පෞරාණික හා සම්භාවනීය සිද්ධස්ථානයකි. අස්ගිරි මහාවිහාරය මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි විශාලතම හා වඩාත් වැදගත් ම බෞද්ධ ආයතනය යි (ලෝරි,1896: 105). අස්ගිරි මහාවිහාරයේ තෙරුන් වහන්සේලා මහනුවර රාජධානිය ආරම්භ කිරීමට පෙර සිට ම රජවරුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කර ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන භික්ෂු නිකායක් වශයෙන් පිළිගැනෙන ස්‍යාමෝපාලි මහානිකායේ ප්‍රධාන විහාර පාර්ශ්ව දෙකින් එකක් වන අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මූලස්ථානය ලෙස මෙය සැලකේ (සීලක්ඛන්ධ හිමි, 1997: 01). බුද්ධවචනය වෙනස් නොකොට හැදෑරීම සහ පවත්වාගෙන යෑම මහාවිහාර ස්ථවිරවාදයෙන් මූලික ලක්ෂණය යි (මීගස්කුඹුර, 2016: 26). මේ අනුව මහාවිහාර සම්ප්‍රදාය ආරක්ෂා කොට වාම ශ්‍රී දළදා වහන්සේ සුරක්ෂිත කර ගනිමින් උපසම්පදා ආදි විනයකර්ම පවත්වමින් සංඝ පරිපාලන කටයුතු සිද්ධ කරන මෙරට ප්‍රමුඛතම භික්ෂු මූලස්ථානයක් වශයෙන් අස්ගිරි මහාවිහාරය සැලකේ.

සීතාවක අනාරක්ෂිත ව තිබූ වාම ශ්‍රී දළදා ව මහනුවරට වඩමවාගෙන ඒම සඳහා I විමලධර්මසූරිය රජුගේ අනුග්‍රහයෙන් අස්ගිරි විහාරවාසී ඇල්ලේපොල මංගල තෙරුන් ප්‍රධාන පිරිස් යවා එතෙක් දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දළදා වහන්සේ මහනුවරට වඩමවා I විමලධර්මසූරිය රජු මාළිගාවක් ගොඩ නඟන තෙක් අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරයෙහි තැන්පත් කොට එහි පුදපූජා සඳහා ඇල්ලේපොල මංගල හිමියන් ම යොදවා ඇති අයුරු අස්ගිරි තල්පත වැනි මූලාශ්‍රයවල කියැවේ (ධම්මාලෝක හිමි, 2012: 60). දෙල්ගමු විහාරයෙහි වැඩ සිටිය වාම ශ්‍රී දළදා වහන්සේ මහනුවර රාජධානිය වෙත වඩමවාගෙන ඒම සඳහා මූලික අඩිතාලම සහ අත්තිවාරම දමා ඇත්තේ අස්ගිරි මහාවිහාරයේ වැඩ සිටිය දෙවනගල රතනාලංකාර ගණනායක මාහිමිපාණන් වහන්සේ සහ ගම්පොළ රාජගුරු ධර්මකීර්ති යන හිමිවරුන් ය (කරල්ලියද්ද, 2005: 51). අස්ගිරිය තල්පතෙහි වාම ශ්‍රී දළදා ව දෙල්ගමුවේ සිට අස්ගිරි විහාරයේ ගෙඩිගේ විහාරය හෙවත් දළදා ගමන් විහාරය වෙත ඇල්ලේපොල මංගල හිමියන් ආදි පිරිස විසින් වැඩමවාගෙන ආ බව දක්වන අදහසට ප්‍රතිවිරුද්ධ අදහසක් දළදා පුවත කාව්‍ය ප්‍රබන්ධය සඳහන් කර ඇත (සේනාරත්න, 2001: 100). දෙල්ගමුවේ සිට දළදා ව මහනුවරට වැඩම වීමට I විමලධර්මසූරිය රජුට ගලඋඩ නම් තෙරුන් වහන්සේ නමක් උපස්ථාන කර ඇති බවත් උන්වහන්සේට හිරිපිටියේ නිලමේතුමන් ප්‍රමුඛ කිහිපදෙනෙක් උදව් කර ඇත. ගලඋඩ තෙරුන් දෙල්ගමුවෙන් දළදා ව පළමුව රැගෙනවිත් ඇත්තේ අම්පිටියට ය. රජතුමා එහි ගොස් දළදා ව වැඳ මහනුවර දෙමහල් මන්දිරයක් තනා එහි දළදා ව තැබූ බව දැක්වේ (සේනාරත්න, 2003: 100). අස්ගිරි මහාවිහාරයේ ගණනායක තනතුර දැරූ දෙවනගල රතනාලංකාර තෙරුන්, I විමලධර්මසූරිය රජුට උඩරට රාජාභිෂේකය සහ නැවත බුද්ධාගම වැළඳ ගැනීමට පුරෝගාමී වූ භික්ෂු නායකත්ව චරිතය යි. මෙම සම්බන්ධතාව මත රජුගේ අනුග්‍රහය ඇති ව දෙල්ගමුවෙන් දළදා ව රැගෙන ඒමට අස්ගිරි විහාරවාසී ඇල්ලේපොල මංගල හිමියන් යවනවා වෙනුවට වෙනත් භික්ෂුවක් ඒ සඳහා පිටත් කර හැරීමේ සම්භාවිතාව අල්ප ය. එසේ ම අද පවා අස්ගිරි ගෙඩිගේ විහාරය "අස්ගිරි දළදා ගමන් මාළිගාව" යනුවෙන් ව්‍යවහාර කරනුයේ

එදා නිසැකව ම දෙල්ගමුවේ සිට වාම ශ්‍රී දළදා ව අස්ගිරි ගෙඩිගේ විහාරයට වැඩම වූ නිසාය. අදටත් මහනුවර ඇසළ පෙරහැරේ අවසන් රන්දෝලි පෙරහැර දවසේ දළදා  පෙරහැර අස්ගිරි ගෙඩිගේ විහාරයේ රාත්‍රියක් නතර වී පසුවදා දවල් පෙරහරින් ශ්‍රී දළදා  මාළිගාවට ගෙවදින්නේ එදා දෙල්ගමුවේ සිට දළදා ව අස්ගිරි ගෙඩිගේ විහාරයට වැඩම වූ රාජකීය චාරිත්‍රය සිහිපත් කරවීමට ය. අස්ගිරිය ගෙඩිගේ විහාරය ඊට පෙර සිට ම රාජකීයන්ගේ වැඳුම්පිදුම් ලැබූ සම්භාවනීය රාජපූජිත සිද්ධස්ථානයකි. තව ද මහනුවර නගරයේ ඇති ඉපැරණිතම ගොඩනැගිලි අතර මෙම ගෙඩිගේ විහාරය ද ප්‍රමුඛ ය. වර්තමානයේ දී පෙරහර කරඬුව පිටුපසින් රජතුමා වෙනුවට ගමන් කරන්නේ ශ්‍රී දළදා මාළිගාවේ ගිහි භාරකාරීත්වය හිමි දියවඩන නිලමේතුමා ය. එසේ ම එකල රජුන් සමඟ පෙරහැරේ ගමන් කළ ඇත් අස් රිය පාබල යන චතුරංගනී සේනාව දියවඩන නිලමේවරයා සමඟ අද්‍යතන මහනුවර ඇසළ පෙරහැරේ ගමන් නොකරයි. (අලි ඇත්තු රිය හා පාබල පිරිස් පෙරහැරේ සංකේතාත්මක ව ගමන් කරන අතර අශ්වයින් කිසිසේත්ම පෙරහැරේ ගමන් නොකරයි. පෙරහැර පොලිස් රාජකාරීයේ දී අශ්වයින් ඇතැම්විට දැකගත හැකි ය.

දඹදෙණිය යුගයේ දළදා සංස්කෘතියට ඇතුළත් වූ නව ප්‍රවණතාවන් වශයෙන් දළදා පෙරහැරට දේවාල පෙරහැර සම්බන්ධ වීම දැක්විය හැකි ය. දඹදෙණි අස්නට අනුව සතර දේවාලයවල පෙරහැර, දළදා පෙරහැර සඳහා සම්බන්ධ වූ බවට සාධක විද්‍යමාන වේ. 'සතර දේවාලයෙහි නටන ගයන ධුරවල අයත් තුන් රජයෙහි නටන ගයන පිඹින අයත් ගෙන්වමින් මහා පූජාව මහෝත්සවයෙන් ආරම්භ කළාහු....' දඹදෙණි අස්නයෙහි මෙම උද්ධෘතය පිළිබඳ අදහස් දක්වන කඹුරුගමුවේ වජිර හිමියන් පෙන්වා දෙන්නේ මේ පුවත සනාථ කළ හැකි තවත් සාධක ලැබේ නම් දළදා පෙරහැරට සතර දේවාල පෙරහැර එක්වීමේ මූල් අවස්ථාව දඹදෙණි යුගයට ලැබෙන බව යි (වජිර හිමි, කුඹුරුගමුවේ, 2008: 416). ඒ සඳහා දඹදෙණි යුගයට පෙර යුගය වූ පොළොන්නරු යුගයේ සීඝ්‍ර ද්‍රාවිඩ හින්දු ව්‍යාප්තවාදය සහ එම ද්‍රාවිඩ හින්දු සංස්කෘතික බලපෑම ඊට සාක්ෂි සපය යි.

(මුම්මණිචෝල මණ්ඩලම්, ජනනාථපුරම් වැනි ද්‍රවිඩ නාමකරණය පොළොන්නරු යුගයේ දී ප්‍රචලිත වූවකි.)

දඹදෙණිය යුගයේ දළදා සංස්කෘතියයේ දී තවත් වැදගත් ලක්ෂණයක් වශයෙන් දළදා වහන්සේ වැඩසිටිය දඹදෙණි රාජධානියේ යම්යම් ප්‍රදේශ ආශ්‍රිත ව දළදාව වහන්සේ තදනුබද්ධව ප්‍රභවය වී ඇති ග්‍රාම නාමකරණයන් හඳුන්වා දිය හැකි ය. දළදා වහන්සේ හා සම්බන්ධ ග්‍රාම නාමීකරණයන් ඊට පෙර පැවති අනුරාධපුර හා පොළොන්නරු යුගයන්වල දී දක්නට නොලැබුණත් දඹදෙණි යුගයේ එබඳු දළදා වහන්සේ හා සම්බන්ධ ග්‍රාම නාමීකරණයන් බොහොමයක් වූ නූතනයේ පවා දැකගත හැකි වීම විශේෂිත ය. දඹදෙණි රාජධානියේ යුගයේ දි දළදා මාලිගාව හා සම්බන්ධ වූ එබඳු ග්‍රාමනාමකරණයන් කිහිපයක් හඳුනාගත හැකි ය. මුළුතැන් පූජාව ශ්‍රී මාළිගාවේ සිදු කරන උසස් ම දළදා පූජාව වේ. මේ පූජාවට අයත් ද්‍රව්‍ය සැපයූ ගම මුල්තැන ගම විය හැකි ය. එය අද 'මුරුතැන්ගේ' යන නමින් ව්‍යවහාර වෙයි (වජිර හිමි, කුඹුරුගමුවේ, 2008: 351). එකල දළදා මාළිගාවට සහල් සැපයූ ග්‍රාමය 'සාලියාල' ග්‍රාමය නම් විය. එකල දළදා මාලිගාවට නාරම් මල් සැපයූ ගම 'නාරම්මල' වූ බව ජනප්‍රවාදය යි. එමෙන් ම වර්තමානයෙහි අලව්ව අසල 'දළදාකෙත' නමින් කුඹුරක් ඇත. මෙය දළදා පෙරහැර දකිනු රිසි වූ අන්ධ කාන්තාවකගේ ඇස් පැහැදීම නිසා ඇය විසින් පූජා කළ යැයි ජනප්‍රවාදයේ ඇත (වජිර හිමි, කුඹුරුගමුවේ, 2008: 351). දළදා වහන්සේ දඹදෙණියේ සිට බෙලිගලට වැඩම වන අතරතුර නැවතී දන් වැළඳූ ස්ථානය 'දම්පැලැස්ස' යැයි විශ්වාස කෙරේ. එකල රාජකීය දාන්ශාලාව පැවති ප්‍රදේශය 'කෝදංගේ' නමින් හැඳින්වේ. එමෙන් ම 'කත්ගල' (වජිර හිමි, කුඹුරුගමුවේ, 2008: 351) නමින් තරමක පැතලි ගල් තලාවක් වෙයි. පිටතින් දළදා පූජාවන් සඳහා ගෙන ආ දන් කත් තැන්පත් කොට පිළියෙල කළ ස්ථානය, මෙනමින් හැඳින්වේ.

**සමාලෝචනය**

නූතනයෙහි ලක්දිව දක්නට ලැබෙන දළදා සංස්කෘතියෙහි බොහෝ ගතික සංස්කෘතික ලක්‍ෂණ පූජනීය දළදා සංස්කෘතියට

ඇතුළත් වීමට දඹදෙණිය යුගයේ රාජරාජමහාමාත්‍යන් විසින් ඇති කොට පවත්වා ගෙන ආ වන්දනීය දළදා සංස්කෘතිය ඉවහල් වී ඇති බව පැහැදිලි ය. බෞද්ධයන්ගේ පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ ම සංස්කෘතික අනන්‍යතාව මෙන් ම සංස්කෘතික සංකේතය වශයෙන් සැලකෙන මහනුවර ඇසළ පෙරහැර හෙවත් දළදා පෙරහැරෙහි ආකෘතිය, පෙළගැස්ම ආදිය සඳහා ද දඹදෙණි යුගයේ දළදා සංස්කෘතිය පදනම් වී ඇති බව දැක්විය හැකි ය. ඒ අතර මහනුවර ඇසළ පෙරහැර තුළට නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි ආදි සතර දේවාල පෙරහැර එකතු වීම විශේෂිත ය. දඹදෙණි යුගයේ දී දළදා මාළිගාවෙන් පිටතට හෙවත් බැහැරට දළදාව වඩම්මවා දින අනූවක් වැනි දීර්ඝ කාලයක් දළදා ප්‍රදර්ශන පැවැත් වීම ආදිය ද විශේෂිත ය. එමෙන් ම දඹදෙණිය හා තදනුබද්ධ ප්‍රදේශයන්හි ව්‍යවහාර වන ග්‍රාම හා ස්ථාන නාමකරණය පිළිබඳ විධිමත් අධ්‍යනයක් කරන්නේ නම් දළදා වහන්සේ හා සම්බන්ධ බොහෝ ග්‍රාම හා ස්ථාන නාම වර්තමානයේ දී ද විද්‍යමාන වීම දඹදෙණි දළදා සංස්කෘතියෙහි ඇති විශේෂත්වයක් බව ද ප්‍රකට වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කරල්ලියද්ද, එස්.බී. 2005, *සෙංකඩගල රාජධානියේ ඉතිහාසයෙන් බිඳක්.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මාලෝක හිමි, වරකාවේ. 2012, 'සිරි දළදාවරුණ සහ වෙනත් ලිපි' (සංස්.), අනුරාධා සුධම්මිකා මෙහෙණිය, පුවක්පිටිය: මාගධි පාලි හා බෞද්ධ අධ්‍යාපන ආයතනය.

*දාඨාවංසය*, 2000, (සංස්.) රංජිත් වනරත්න, කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.

*මහාවංසො*, 1959, (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සමාගම.

මීගස්කුඹුර, කේ. 2016, *ශ්‍රී දළදා මාළිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි,* මහනුවර: ශ්‍රී දළදා මාළිගාවේ මාධ්‍ය හා විශේෂ ව්‍යාපෘති කාර්යංශය.

ලෝරි, ආචිබෝල්ඩ්, කැම්බල්, (1896). ලෝරි ගැසටියර් - පළමු වෙළුම *(A Gazetteer of the Central Province of Ceylon* සිංහල පරිවර්තනය - උපාලි (කිරිඳියගොඩ) මහනුවර: මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව.

වජිර හිමි, කුඹුරුගමුවේ, 2008, *දළදා ඉතිහාසය හා සංස්කෘතිය*, මරදානඃ ගොඩගේ සහ සමාගම.

සන්නස්ගල, පුංචිබණ්ඩාර, 1998, *සිංහල සාහිත්‍ය වංශය*, මරදානඃ ගොඩගේ සහ සමාගම.

*සිංහල මහාවංසය*, 1998, (සංස්.) විජිතනන්ද සරත්චන්ද්‍ර, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ, 1997, *අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය*, විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සේනාරත්න, ජී. ඇම්. 2001, *ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද*. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එම, 2003, *ලක්දිව බුදුසසුන හා සිංහල සංස්කෘතිය*. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.